# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ

**වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් යම් තැනැත්තකුගේ මරණය සිදුවීම සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය විසින්
2018 ඔක්තෝබර් මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 සැප්තැම්බර් මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[269 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ

එල්.ඩී.—ඕ. 25/2017

**වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් යම් තැනැත්තකුගේ මරණය සිදුවීම සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2018 අංක      දරන යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නඩුවක් පවත්වාගෙන යෑමේ අයිතිය.

2. (1) යම් තැනැත්තකුගේ මරණය වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් සිදුවන අවස්ථාවක දී, එම යම් තැනැත්තාගේ මරණය සිදුවූයේ වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාව, නොකර හැරීම, අතපසු කිරීම හෝ පැහැර හැරීම හේතුවෙන් ද, එම වෙනත් යම් තැනැත්තාට එරෙහිව අලාභ අය කරගැනීම සඳහා නඩුවක් පවත්වාගෙන යෑමට, (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු වෙත අයිතියක් තිබිය යුතු ය.

(2) (අ) දෙමව්පියන්ගෙන් අයකු හෝ දෙමව්පියන් එක්ව;

(ආ) ළමයකු හෝ ළමයින් එක්ව;

(ඇ) සහෝදර සහෝදරියන්ගෙන් අයකු හෝ සහෝදර සහෝදරියන් එක්ව;

(ඈ) සීයා හෝ ආච්චි හෝ සීයා හා ආච්චි එක්ව; හෝ

(ඉ) භාරකරු,

විසින් නඩුව පවත්වාගෙන යා හැකි ය.

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ.

**3.** යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා වූ නඩුවක දී, ඉල්ලුම්කරු විසින්—

(අ) එම තැනැත්තාගේ ආදරය සහ කරුණාව මෙන්ම ඒකවරණය සහ සහසම්බන්ධතාව අහිමිවීම සම්බන්ධයෙන්; සහ

(ආ) මානසික වේදනාව සහ පීඩාව සම්බන්ධයෙන්,

අලාභ අය කරගනු ලැබිය හැකි ය.

අනුප්‍රාප්තිය සඳහා අයිතියක් නැති බව.

**4.** (අ) මේ පනත යටතේ හිමිකම් පෑමක් කිරීමට පෙරාතුව; හෝ

(ආ) හිමිකම් පෑමක් කිරීමෙන් පසුව එහෙත් නඩු තීන්දුව ලබා දීමට පෙරාතුව,

ඉල්ලුම්කරු මියයන අවස්ථාවක දී, අලාභ ලබාගැනීම සඳහා මියගිය ඉල්ලුම්කරුගේ උරුමක්කරුවන්ට, පොල්මඃකරුවන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට කිසිදු අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

විද්වතකුගේ සහාය ලබාගැනීම.

**5.** මේ පනත යටතේ වූ යම් කරුණක් තීරණය කිරීමේ කාර්යය සඳහා, අධිකරණය විසින් සලකා බලනු ලබන කරුණට අදාළව යම් විශේෂිත කුසලතාවයක් ඇති තැනැත්තන් එක් අයකුගේ හෝ වැඩි දෙනකුගේ සහාය ලබා ගැනීම සඳහා කැඳවනු ලැබිය හැකි ය.

අත්හැර දැමීමක් සිදු වී ඇති අවස්ථාවක දී අලාභ ගෙවීම.

**6.** මියගිය තැනැත්තා අත්හැර දමා ඇත්තා වූ යම් තැනැත්තකුට මේ පනත යටතේ අලාභ ඉල්ලීම සඳහා හිමිකමක් නොතිබිය යුතු ය.

වෙනත් යම් ප්‍රතිකර්මයකට අතිරේකව මේ පනතේ විධිවිධාන පවතින බව.

**7.** මේ පනතේ විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක් හෝ අලිඛිත නීතියක් මඟින් විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් අයිතියකට හෝ ප්‍රතිකර්මයකට අතිරේකව විය යුතු මෙන්ම සහ එම අයිතිය හෝ ප්‍රතිකර්මය එමඟින් අඩු කරනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.